Archaeological Society of Sri Lanka

# පුරාවිද්‍යා පුවත්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පුවත් හසුන

13 වෙළුම
3 කලාපය
2017
සැප්.-දෙසැ.

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පළමු පර්යේෂණ සම්මන්ත්‍රණය 2018 පෙබරවාරි

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ 2017/2018 වර්ෂය සඳහා අනුමත වැඩසටහනේ එක් කාර්යයක් ලෙස පර්යේෂණ සම්මන්ත්‍රණයක් පැවැත්වීම දැක්විය හැකිය. 'පුරාවිද්‍යා-ඉතිහාස පර්යේෂණ සම්මන්ත්‍රණය' නමින් මෙය 2018 වර්ෂයේ පෙබරවාරි මාසයේ පැවැත්වීමට සංගමය තීරණය කර තිබේ.

ඒ සඳහා පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට සංගමයේ සාමාජිකයන්ට හා සෙසු පර්යේෂකයන්ට අවස්ථාව ඇත. ඒ පිළිබඳ විස්තර හා පර්යේෂණ පත්‍රිකා කැඳවීමේ නිවේදනය දෙවන පිටුවේ දැක්වේ. අපට ලැබෙන පර්යේෂණ පත්‍රිකා සමීක්ෂණයට ලක් කර ඉදිරිපත් කිරීම සඳහා තෝරාගනු ලැබේ. ඒ සඳහා සම්බන්ධ වීමට ඔබට මෙසේ ආරාධනා කරමු.

2 පිටුවට

## දෙදින අධ්‍යයන චාරිකාව 2017 නොවැම්බර් 4-5

කුරුණෑගල දිස්ත්‍රික්කයේ හා ඒ අවට පිහිටි වැදගත් පුරාවිද්‍යා ස්ථාන නැරඹීම සඳහා දෙදින අධ්‍යයන චාරිකාවක් සංවිධානය කිරීමට විධායක සභාව තීරණය කර ඇත. නොවැම්බර් මස 4 හා 5 යන දෙදිනට (සෙනසුරාදා හා ඉරිදා) යොදාගෙන ඇති මේ චාරිකාවේදී පහත සඳහන් ස්ථාන නැරඹීමට අපේක්ෂා කරනු ලැබේ.

- පඬුවස්නුවර
- කන්දෙමැදගම
- නාතගනේ
- වැල්ලාගල
- දැදුරුඔය පැරණි වේල්ල
- තිල්ලක්ගම
- සැස්සේරුව

චාරිකාව සඳහා සහභාගිවීමට කැමැත්තක් දක්වන සාමාජිකයන් ඒ බව 2017 සැප්තැම්බර් මස 10 දින රැස්වීමේදී ඔබේ නම හා දුරකථන අංකය ලබා දෙන මෙන් ඉල්ලා සිටිමු. (ඒ බව විද්‍යුත් තැපැල් මගින් (archaeology.org.lk@gmail.com) හෝ සමලේකම්වරුන් දුරකථනයෙන් අමතා දැන්වීමටද හැකිය.)

මෙම චාරිකාව සඳහා වන ගාස්තුව චාරිකාවට සහභාගිවන්නන් වෙත දැනුම් දෙනු ලබන අතර, එම මුදල 2017 ඔක්තෝබර් මස 08 වන දින රැස්වීම දින වන විට ගෙවිය යුතුය.

(ඉහත ස්ථාන හැර මෙම චාරිකාවේදී නැරඹීමට හැකි ඔබ සිතන තවත් ස්ථාන වෙතොත් ඒ බව අප වෙත දැනුම් දෙන මෙන් ඉල්ලා සිටිමු.)

## යාවජීව සාමාජිකයන් සඳහා සාමාජිකපත් නිකුත් කිරීම - විස්තර 3 වැනි පිටුවේ

## මාසික වැඩසටහන්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ මාසික වැඩසටහන් මාලාව යටතේ මීළඟ මාස හතර ඇතුළත පැවැත්වීමට නියමිත වැඩසටහන් මෙසේය.

- **සැප්තැම්බර් 10 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:
  ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා ප්‍රතිපත්තිය හා යෝජිත පුරාවිද්‍යා ප්‍රධාන සැලැස්ම

  දේශක: ආචාර්ය සිරාන් දැරණියගල මහතා
  (හිටපු අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව)

- **ඔක්තෝබර් 08 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:
  ශ්‍රී ලංකාවේ දාගැබ් කැනීම්

  දේශක: ආචාර්ය නිමල් පෙරේරා මහතා
  (අධ්‍යක්ෂ, සබරගමු ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල සහ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව)

- **නොවැම්බර් 12 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:
  ශ්‍රී ලංකාවේ පැරණි මාර්ග පද්ධති

  දේශක: ආචාර්ය පී. විදානපතිරණ මිය
  (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය)

- **දෙසැම්බර් 10 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:
  මධ්‍යම ආසියාවේ හා ලංකාවේ බෞද්ධ බිතුසිතුවම්

  දේශක: බින්දු උරුගොඩවත්ත මෙනවිය
  (නියෝජ්‍ය අධ්‍යක්ෂ - පර්යේෂණ, සාක් සංස්කෘතික මධ්‍යස්ථානය)

**ඉහත දේශන කොළඹ 7, ආනන්ද කුමාරස්වාමි මාවතේ, අංක 96 දරණ තැන පිහිටි රාජකීය ආසියාතික සමිතියේ රැස්වීම් ශාලාවේදී පැවැත්වේ. (මහවැලි කේන්ද්‍ර ගොඩනැගිල්ලේ පළමු මහළේ)**

- දේශන පැවැත්වෙන දිනවල ප.ව. 1.00ට සංගමයේ විධායක සභා රැස්වීම පැවැත්වේ. ඒ සඳහා ගරු විධායක සභිකයින්ගේ පැමිණීම අපේක්ෂා කරමු.

# පුරාවිද්‍යා හා ඉතිහාස පර්යේෂණ සම්මන්ත්‍රණය 2018

## 2018 පෙබරවාරි මස කොළඹදී පැවැත්වේ

## සංවිධානය - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය

## පර්යේෂණ පත්‍රිකා කැඳවීම

**විෂය - ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාව හා ඉතිහාසයට අදාළ ඕනෑම විෂයයක්**

**මාධ්‍යය - සිංහල හා ඉංග්‍රීසි**

### සාරාංශ සඳහා මාර්ගෝපදේශ

- වචන 1000-1200 අතර ප්‍රමාණයේ විස්තීර්ණ සාරාංශයක් (extended abstract) ඉදිරිපත් කළ යුතුය.
- සියලු විස්තීර්ණ සාරාංශ MS WORD ලේඛනයක් ලෙස සකස් කළ යුතුය.
- භාවිත කළ යුතු අකුරු වර්ග හා පිටු සැකසුම පිළිබඳ කරුණු
  - සිංහල - FM Abhaya හෝ යුනිකෝඩ් සිංහල අකුරු
  - ඉංග්‍රීසි - Times New Roman
  - අකුරු ප්‍රමාණය - 12 point
  - පේළි අතර ඉඩ - 1.5
- කර්තෘ හෝ කර්තෘවරුන් පිළිබඳ පහත සඳහන් විස්තර ඇතුළත් කළ යුතුය
  - නම/ නම්
  - විද්‍යුත් තැපැල් ලිපින
  - දුරකථන අංක
  - සේවය කරන ආයතන (වේ නම්)
- මුඛ්‍ය පද (keywords) 5ක් සඳහන් කළ යුතුය.
- විස්තීර්ණ සාරාංශයට අදාළ වන ප්‍රධාන මූලාශ්‍ර ඇතුළත් කළ හැකිය.

**සාරාංශ එවිය යුතු ලිපිනය** - asslconf@gmail.com (විද්‍යුත් තැපැල් මගින් පමණි.)

### වැදගත් දින

සාරාංශ එවිය යුතු අවසන් දිනය - 2017 නොවැම්බර් 15
සාරාංශ පිළිගත් බව දැනුම් දෙන දිනය - 2017 දෙසැම්බර් 31
සම්පූර්ණ පත්‍රිකාව ලබා දීම හා ලියාපදිංචිය - 2018 ජනවාරි 31 දිනට පෙර

**ලියාපදිංචි වීමේ ගාස්තු** - මීට පත්‍රිකා එකතුව, දිවා ආහාර හා තේ පැන් ඇතුළත්ය

පත්‍රිකා ඉදිරිපත් කරන්නන් රු. 800/=
සහභාගි වන්නන් සඳහා රු. 600/=

## මෙම පුවත්හසුන විද්‍යුත් තැපැල් මගින් පමණක් ලබාගැනීමට ඔබ කැමැතිද?

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පුවත්හසුන වන 'පුරාවිදු පුවත්' පුවත් හසුන තැපැල් මාර්ගයෙන් වෙනුවට PDF ගොනුවක් ලෙස විද්‍යුත් තැපැල් (email) මගින් පමණක් ලබාගැනීමට ඔබ කැමැතිද? එසේ නම් පහත සඳහන් එක් ක්‍රමයක් භාවිත කර ඒ බව අප වෙත දැනුම් දෙන මෙන් ඉල්ලා සිටිමු.

- සංගමයේ විද්‍යුත් තැපැල් ලිපිනය වන archaeology.org.lk@gmail.com වෙත පණිවුඩයක් එවීම - එහි Subject තීරුවේ PDF Only ලෙස සඳහන් කර නම හා සාමාජික අංකය පණිවුඩය තුළ (body) සඳහන් කළ යුතුය.
- https://goo.gl/MbbYpF ලිපිනයට පිවිස එහි ඇති Google Form (ආකෘති පත්‍රය) පුරවා submit කිරීමෙන් -

ගරු සමලේකම්වරු
2017.08.13

# ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ සාමාජිකපත් නිකුත් කිරීම

**සංගමයේ යාවජීව සාමාජිකයන් වෙත කරන විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ යාවජීව සාමාජිකයන් වෙත සාමාජිකපත් නිකුත් කිරීමට සංගමය තීරණය කර ඇති බව සතුටින් දන්වමු. මෙම සාමාජිකපත ඔබගේ විස්තර හා ඡායාරූපයද සහිතවූ ප්ලාස්ටික් කාඩ්පතක් වන අතර, ලබාගැනීමට අවශ්‍ය සාමාජිකයන් **මේ සමඟ යා කර ඇති ආකෘතිපත්‍රය** පුරවා මේ සඳහා පිරිවැය වශයෙන් රුපියල් 300/=ක මුදලක් (මුදලින් හෝ චෙක්පත් මගින්) සමඟ සමලේකම්වරුන් වෙත ලබාදීමෙන් ඔබගේ සාමාජිකපත ලබාගත හැක.

සකස් කරන ලද සාමාජිකපත සංගමයේ රැස්වීමකදී ලබාගැනීමට හෝ ලියාපදිංචි තැපෑලෙන් ලබාගැනීමට හැකි අතර, ඔබේ තේරීම ඉහත ආකෘති පත්‍රයේ අදාළ ස්ථානයේ සඳහන් කළ යුතුය.

ගරු සමලේකම්වරු
2017.08.13

# ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ වැඩසැලසුම

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ 51 වන වාර්ෂික මහසභා රැස්වීමේදී සංගමයේ අභිනවයෙන් පත්වූ සමලේකම්වරයෙකු වන මුදිත කරුණාමුනි මහතා විසින් සංගමය මගින් ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසැලසුමක් සංගමයේ විධායක සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, එය සභාව විසින් පිළිගන්නා ලදි.

එම වැඩසැලසුම හා තවත් යෝජනා පිළිබඳව සංගමයේ විධායක සභාව 2017.08.02 වන දින රැස්වී දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදි. එහිදී සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු මෙසේය.

I. පාර්ලිමේන්තු පනතක් මගින් සංගමය සංස්ථාපනය කිරීම
II. රජයෙන් වාර්ෂික අනුග්‍රහයක් ලබා ගැනීම
III. පර්යේෂණ සමුළුවක් පැවැත්වීම
IV. චාරිකා සංවිධානය - කෙටිදුර චාරිකා 3ක් හා දිගුදුර චාරිකා 1 ක් සංවිධානය කිරීම
V. සංගමය මගින් ශාස්ත්‍රීය ප්‍රකාශනයක් හා/හෝ පැරණි ප්‍රකාශනයක නව මුද්‍රණයක් ප්‍රකාශයට පත් කිරීම
VI. පුරාවිද්‍යා සංහිතා සඟරාවේ නව වෙළුමක් හා සංගමයේ ඉතිහාස කෘතිය ප්‍රකාශයට පත් කිරීම
VII. පුරාවිද්‍යා හා ඉතිහාස ක්ෂේත්‍රයට අදාළව රටේ සිදුවන සිදුවීම් සම්බන්ධව ක්‍රියාකාරීව මැදිහත් වීම
VIII. අන්තර්-ජාතික සබඳතා වර්ධනය
IX. පුරාවිද්‍යාවට සම්බන්ධ දේශීය ආයතන සමග සබඳතා වර්ධනය
X. ජාත්‍යන්තර පුරාවිද්‍යා දිනය සැමරීම
XI. පාසැල් පෙළ පොත්වල ඉතිහාස විෂයට අදාළව නිවැරදි කිරීම් සඳහා සංගමය මැදිහත් වීම
XII. සංගමයේ පැතිකඩ (Profile) සැකසීම
XIII. සාමාජික ප්‍රවර්ධන වැඩසටහන

මෙම වැඩසැලසුමේ ඇතුළත් කරුණු සම්බන්ධව සංගමය මේ වන විටද කටයුතු කරමින් සිටියි. එම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා වැදගත් වන ඔබගේ යෝජනා හා අදහස් සංගමය ඉතා අගයකොට සලකන අතර, එම යෝජනා හා අදහස් නොපමාව සමලේකම්වරුන් වෙත ලැබීමට සලස්වන්න.

ගරු සමලේකම්වරු
2017.08.13
විද්‍යුත් තැපැල - archaeology.org.lk@gmail.com

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ලිපිනය හා දුරකථන අංක


ලිපිනය - සම්බන්ධීකරණ ලේකම්
ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.

විද්‍යුත් තැපැල -
archaeology.org.lk@gmail.com
වෙබ් අඩවිය -
www.archaeology.org.lk

- ගරු සභාපති
  මහින්ද මලලසේකර 072-3322411
- ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති
  රංජිත් හේවගේ 071-1712894
- ගරු උප සභාපති
  කාවන් රත්නතුංග 071-7072020
- ගරු සමලේකම්වරු
  මුදිත කරුණාමුනි 071-2287497
  යොහාන් පෙරෙයිරා 077-9651201
- ගරු සම්බන්ධීකරණ ලේකම්
  සංජීවනී විද්‍යාරත්න 071-5872591
- ගරු භාණ්ඩාගාරික
  ලක්ෂ්මන් රත්නායක 077-7985543
- ගරු සංස්කාරක
  ධනේෂ් විසුම්පෙරුම 071-4310794


## නිවේදන

- සාමාජික අයදුම්පත් සංගමයේ වෙබ් අඩවියෙන් PDF ලේඛනයක් ලෙස බාගත කළ (download) හැකිය.
- පුරාවිද්‍යා සංහිතා 6 කලාපය සංගමයේ රැස්වීම්වලදී හා සරසවි හා කියවන නුවණ (නුගේගොඩ) පොත්හල්වලින් ලබාගත හැකිය.
- අපගේ Google **කණ්ඩායමේ ඊමේල් පණිවුඩ නොලැබේද?** එසේ නම් ඔබේ නම, ලිපිනය හා සාමාජික අංකය සඳහන් කළ SMS පණිවුඩයක් සමලේකම් යොහාන් පෙරෙයිරා වෙත 077-9651201 අංකයට යොමු කරන්න.


**පුරාවිදු පුවත් සංස්කරණය**
ධනේෂ් විසුම්පෙරුම
ගරු සංස්කාරක
dhaneshw@gmail.com


# සංගමයේ නිවේදන

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පණස් වසරක ඉතිහාසය පිළිබඳ කෘතිය ඉදිරියේදී නිකුත් වේ

**ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පණස් වසරක ඉතිහාසය** කෘතිය මේ වන විට මුද්‍රණයට සූදානම්ව පවතී. එය 2017 නොවැම්බර් මාසයේදී එළිදැක්වීමට නියමිතය.

මෙම කෘතිය මිලදී ගැනීම සඳහා මුදල් ගෙවා වෙන්කරගත් සාමාජිකයින්ට සංගමයේ නොවැම්බර් මස රැස්වීමේදී එය ලබා ගත හැකිය. තැපැල් මගින් ලබාගැනීම සඳහා ඉල්ලුම් කළ සාමාජිකයින්ට නොවැම්බර් මාසය ඇතුළත එය තැපැල් මගින් එවනු ලැබේ. කෘතිය මුද්‍රණයේදී ඇති වූ ප්‍රමාදය පිළිබඳව කණගාටුව පළ කරමු.

## අළෙවිය සඳහා ඇති ප්‍රකාශන




සංගමය මගින් නිකුත් කර ඇති පහත සඳහන් ප්‍රකාශන හා මුල්දින කවර රැස්වීම් දිනවලදී ලබා ගත හැකිය.

- ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා වෙළුම 4 (2014) මිල රු. 170 (සාමාජිකයන් සඳහා මිල රු. 100)
- ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා වෙළුම 6 (2016) මිල රු. 250 (සාමාජිකයන් සඳහා මිල රු. 220)
- 50 වන සංවත්සරය නිමිත්තෙන් 2016 සැප්තැම්බර් මාසයේදී නිකුත් කළ තැපැල් මුද්දරය හා මුල්දින කවරය (මිල රු. 50)



## සංගමයේ සාමාජික ප්‍රවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ සාමාජිකත්වය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් දියත් කර තිබේ. ඒ අනුව සංගමයේ සාමාජිකත්වය ලබාගැනීමට සුදුසුකම් ඇති ඔබ පුද්ගලිකව දන්නා පුද්ගලයින් සංගමය වෙත හඳුන්වාදෙන මෙන් සාමාජිකයන්ගෙන් ඉල්ලීමක් කරනු ලැබේ.

පහත සඳහන් සාමාජික වර්ග යටතේ අප හා සම්බන්ධවීමට කැමැත්තක් දක්වන සාමාජිකයන්ට ඒ ඒ සාමාජික වර්ගයට අදාළ සුදුසුකම් පිළිබඳ විස්තර හා සාමාජික අයදුම්පත www.archaeology.org.lk/mship.htm යන වෙබ් ලිපිනයට පිවිසීමෙන් ලබාගත හැකිය.

- යාවජීව සාමාජික (යාවජීව සාමාජික ගාස්තුව රු. 1,500)
- සාමාන්‍ය සාමාජික (වාර්ෂික සාමාජික ගාස්තුව රු. 300)
- ශිෂ්‍ය සාමාජික (වාර්ෂික සාමාජික ගාස්තුවක් නැත)
- ආයතන සාමාජික (වාර්ෂික සාමාජික ගාස්තුව රු. 2,000)

මීට අමතරව සෑම සාමාජිකයෙකුම රු. 100ක ඇතුළුවීමේ ගාස්තුවක් ගෙවිය යුතුය.


**පුරාවිදු පුවත්** - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ සාමාජිකත්වය වෙනුවෙන් පළකෙරෙන පුවත් හසුනයි.



**ආපසු:**
සංජීවනී විද්‍යාරත්න
සම්බන්ධීකරණ ලේකම් - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.